# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**2021 සැප්තැම්බර් මස 24 වන දින**

**II වන කොටස**

**අතිරේකය**

**(2021.09.27 දින නිකුත් කරන ලදී)**


# දස්සනා බෞද්ධ සංවිධානය (සංස්ථාගත කිරීමේ)

*(පෞද්ගලික මන්ත්‍රීවරයන්ගේ පනත් කෙටුම්පතකි)*

**දස්සනා බෞද්ධ සංවිධානය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

ගාල්ල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු චන්දිම වීරක්කොඩි මහතා විසින්
පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීම පිණිසයි


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 18.00 තැපැල් ගාස්තුව : රු. 15.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# දස්සනා බෞද්ධ සංවිධානය (සංස්ථාගත කිරීමේ)

## දස්සනා බෞද්ධ සංවිධානය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

*පූර්විකාව*

"දස්සනා බෞද්ධ සංවිධානය" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන සංවිධානයක්, එකී සංවිධානයේ සාමාජිකයන් එකඟ වී ඇති රීතිවලට අනුකූලව, එකී සංවිධානය සම්බන්ධ සියලු කරුණු ඵලදයී ලෙස ක්‍රියාවේ යෙදවීමේ සහ ඉටු කිරීමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබූ හෙයින් ද:

එකී සංවිධානය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කාරණා සඳහා ද, එකී පරමාර්ථ සහ කාරණා මෙතෙක් කල් එකී සංවිධානය විසින් සාර්ථකව ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් සහ එකී සංවිධානය සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති හෙයින් ද, එකී ඉල්ලීමට ඉඩදීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

*ලුහුඬු නාමය*

1. මේ පනත 2021 අංක    දරන දස්සනා බෞද්ධ සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

*දස්සනා බෞද්ධ සංවිධානය සංස්ථාගත කිරීම*

2. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ    ඉන් පසු (මෙහි මින්මතු "සංවිධානය" යනුවෙන් සඳහන් කරනු ලබන) දස්සනා බෞද්ධ සංවිධානය දැනට සාමාජිකයන්ව සිටින තැනැත්තන් සහ මෙයින් පිහිටුවනු ලබන සංස්ථාවේ සාමාජිකයන් වශයෙන් මින්මතු ඇතුළත් කරනු ලබන තැනැත්තන් ද, "දස්සනා බෞද්ධ සංවිධානය" යන නාමය හා අභිධනය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති (මෙහි මින්මතු "සංස්ථාපිත මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාපිත මණ්ඩලයක් වන්නේ ය. තව ද, එකී නාමයෙන් ඒ සංස්ථාපිත මණ්ඩලය විසින් ද, ඊට විරුද්ධව ද, නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද, එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද, පූර්ණ බලය සහ අධිකාරය එකී සංස්ථාපිත මණ්ඩලයට ඇත්තේ ය.

*සංස්ථාපිත මණ්ඩලයේ පොදු පරමාර්ථ*

3. සංස්ථාපිත මණ්ඩලය සංස්ථාපනය කරනු ලබන්නේ පහත සඳහන් පොදු පරමාර්ථ සඳහා බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ:—

(අ) සතර සතිපට්ඨාන භාවනා වැඩසටහන් සංවිධානය කොට පැවැත්වීම;

(ආ) ථෙරවාදී බුදු දහමේ පණිවුඩය වන්නා වූ සිත පිරිසිදු කිරීමේ ක්‍රියාවලිය සමාජය තුළ පැතිරවීම;

(ඇ) බැබලාගම නාගලෙන් රජමහා විහාරයේ වාසය කරන භික්ෂූන් වහන්සේලාට, දසසිල් මාතාවන්ට සහ උපාසක, උපාසිකාවන්ට අවශ්‍ය සිව්පසය සපයා දීම;

(ඈ) ථෙරවාදී බුදු දහම රැකගැනීමේ අරමුණින් යෝග්‍ය වැඩසටහන් සහ ක්‍රියාකාරකම් සංවිධානය කිරීම.

ආණ්ඩුවේ හෝ පළාතක යම් අමාත්‍යාංශයක හෝ දෙපාර්තමේන්තුවක වැඩ සමග ගැටීමක් ඇති නොවීමට සංස්ථාපිත මණ්ඩලය සහතික විය යුතු බව

4. සංස්ථාපිත මණ්ඩලයේ අරමුණු, සංස්ථාවේ වැඩ සහ ඒ හා සමගාමීව ආණ්ඩුවේ හෝ යම් පළාත් සභාවක අමාත්‍යාංශයක් හෝ දෙපාර්තමේන්තුවක් මගින් කරගෙන යන යම් වැඩ අතර ගැටීමක් උද්ගත නොවන ආකාරයට කරගෙන යා යුතු ය.

සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු කළමනාකරණය කිරීම

5. (1) සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු කළමනාකරණය කිරීම සහ පරිපාලනය කිරීම මේ පනතේ විධිවිධානවලට සහ 9 වන වගන්තිය යටතේ සාදන ලද සංස්ථාපිත මණ්ඩලයේ රීතිවලට යටත් ව, බැබලාගම නාගලෙන් රජමහා විහාරවාසී භික්ෂූන් වහන්සේ නමක් විය යුතු සභාපතිවරයකු, උපසභාපතිවරු දෙදෙනකු ලේකම්වරයකු, සහකාර ලේකම්වරයකු, භාණ්ඩාගාරිකවරයකු සහ 9 වන වගන්තිය යටතේ සාදනු ලබන රීතිවලට අනුකූලව තෝරාපත් කර ගනු ලබන හෝ පත් කර ගනු ලබන තවත් සාමාජිකයන් යම් සංඛ්‍යාවකින් සමන්විත වූ විධායක මණ්ඩලයක් මගින් පාලනය විය යුතු ය.

(2) (අ) සංස්ථාපිත මණ්ඩලයේ ප්‍රථම අතුරු මණ්ඩලය මේ පනත ආරම්භ වන දිනට පෙරාතුවම වූ දිනයේ දී සංවිධානයේ විධායක මණ්ඩලයේ සාමාජිකයන් වශයෙන් ධුර දැරුවා වූ තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු අතර, එම අතුරු මණ්ඩලය, 9 වන වගන්තිය යටතේ සාදනු ලබන රීතිවලින් විධිවිධාන සලසා ඇති පරිදි අලුත් විධායක මණ්ඩලයක් පත් කරනු ලබන හෝ තෝරා පත්කරගනු ලබන තෙක් කටයුතු කළ යුතු ය.

(ආ) අතුරු මණ්ඩලයට සංස්ථාපිත මණ්ඩලයේ අන්තර් පරිපාලනය සම්බන්ධයෙන් සහ සංස්ථාපිත මණ්ඩලයේ පළමු විධායක මණ්ඩලයේ සාමාජිකයන් තෝරා පත්කර ගැනීම හෝ පත්කර ගැනීම සම්බන්ධයෙන් රීති සාදගැනීම සඳහා බලය ඇත්තේ ය.

(ඇ) අතුරු මණ්ඩලයේ යම් තීරණයක්, එහි යම් රැස්වීමක් සඳහා පැමිණ සිටින සාමාජිකයන් බහුතරය විසින් ගනු ලැබිය යුතු ය.

(ඈ) සංස්ථාපිත මණ්ඩලයේ ප්‍රථම විධායක මණ්ඩලය, මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයේ සිට අවුරුදු එකක් ඇතුළත පත් කර ගැනීම හෝ තෝරා පත්කර ගැනීම කළ යුතු ය.

(3) (අ) විධායක මණ්ඩලයේ සෑම ධුර දරන්නෙක් ම අවුරුදු එකක කාලසීමාවක් සඳහා පත්කර ගැනීම හෝ තෝරා පත්කර ගැනීම කළ යුතු අතර, එවැනි යම් ධුර දරන්නකු එම එක් අවුරුදු කාලසීමාව ඉකුත් වූ පසු නැවත පත් කර ගනු ලැබීමට හෝ තෝරා පත්කර ගනු ලැබීමට හිමිකම් ලබන්නේ ය.

(ආ) යම් ධුර දරන නිලධරයකු මියයාම, ඉල්ලා අස්වීම, නොහැකියාව හෝ ධුරයෙන් ඉවත් කිරීම හේතුවෙන් පුරප්පාඩුවක් ඇති වන අවස්ථාවක, විධායක මණ්ඩලය විසින් සංස්ථාපිත මණ්ඩලයේ රීතිවලට සැලකිල්ලක් දක්වමින් එම පුරප්පාඩුව පිරවීම සඳහා තැනැත්තකු පත් කිරීම හෝ තෝරාපත් කර ගැනීම කළ යුතු ය.

(ඇ) (ආ) ඡේදය යටතේ පත්කර ගනු ලැබූ හෝ තෝරා පත්කර ගනු ලැබූ තැනැත්තා, ඔහු අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් නොගෙවී ඉතිරිව ඇති කාලය සඳහා ධුර දරනු ලැබිය යුතු ය.

#### අනුශාසක

**6.** බැබලාගම නාගලෙන් රජමහා විහාරයේ වැඩවසන නායක ස්වාමීන් වහන්සේ සංස්ථාපිත මණ්ඩලයේ පරිපාලනය සහ කළමනාකරණය සම්බන්ධයෙන් විධායක මණ්ඩලයට අනුශාසනා කිරීම සඳහා අනුශාසකවරයා විය යුත්තේ ය.

#### සංස්ථාපිත මණ්ඩලයේ කමිටු

**7.** සංස්ථාපිත මණ්ඩලයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා විධායක මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි වූ, සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන්ගෙන් සමන්විත වන්නා වූ යම් කමිටු හෝ අනුකමිටු 9 වන වගන්තිය යටතේ සාදනු ලබන රීතිවලට අනුකූලව පත්කර ගත යුතු ය.

**8.** මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, සංස්ථාපිත මණ්ඩලයට පහත සඳහන් බලය ඇත්තේ ය:— සංස්ථාපිත මණ්ඩලයේ බලතල

(අ) සංස්ථාපිත මණ්ඩලයේ අරමුණු ප්‍රවර්ධනය කිරීමේ අදහසින් විධායක මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි පරිදි වූ සංස්ථාපිත මණ්ඩලයේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි ඉඩම් හෝ ගොඩනැගිලි මිලදී ගැනීම, අත්පත් කර ගැනීම, ඉදිකිරීම, අලුත්වැඩියා කර ගැනීම හෝ වෙනත් ආකාරයකින් ලබාගැනීම සහ බැහැර කිරීම;

(ආ) ඇප සහිතව හෝ නැතිව අරමුදල් එකතු කිරීම හෝ ණයට ගැනීම සහ ශ්‍රී ලංකාවේ හෝ විදේශ ප්‍රභවයන්ගෙන් මුදල් හෝ ද්‍රව්‍යමය ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග භාරගැනීම:

එසේ වුව ද, විදේශීය ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග සම්බන්ධයෙන් විධායක මණ්ඩලය විසින් විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ පූර්ව ලිඛිත අනුමතය ඒ සඳහා ලබාගත යුතු ය;

(ඇ) සංස්ථාපිත මණ්ඩලයේ අරමුණු සඳහා වහා අවශ්‍ය නොවන යම් අරමුදල් විධායක මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් ආකාරයකට ආයෝජනය කිරීම;

(ඈ) සංස්ථාපිත මණ්ඩලයේ නිලධරයන් සහ සේවකයන් පත් කිරීම, ඔවුන් සේවයේ යෙදවීම, සේවයෙන් පහකිරීම හෝ සේවය අවසාන කිරීම සහ ඔවුන් විෂයෙහි විනය පාලනය සහ ඔවුනට සංස්ථාපිත මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් වැටුප් හෝ දීමනා ගෙවීම;

(ඉ) විධායක මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි පරිදි වූ යම් බැංකුවක හෝ බැංකුවල ජංගම, ඉතිරි කිරීමේ හෝ වෙනත් යම් ගිණුම් විවෘත කිරීමේ සහ ඒවා පවත්වාගෙන යාම සහ වසාදැමීම;

(ඊ) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය විය හැකි ගිවිසුම් හෝ කොන්ත්‍රාත්වලට සෘජුව හෝ තත් කාර්ය සඳහා සංස්ථාපිත මණ්ඩලය විසින් බලය පවරනු ලැබූ යම් නිලධරයකු හෝ අනුයෝජිතයකු මගින් ඇතුළු වී ඒවා ඉටු කිරීම හෝ ක්‍රියාවේ යෙදවීම;

(ඊ) විධායක මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි අවශ්‍ය අවස්ථාවලදී සංස්ථාපිත මණ්ඩලයේ යම් කර්තව්‍ය කරගෙන යෑම සඳහා යම් කමිටු හෝ අනුකමිටු පත් කර ගැනීම;

(ඌ) සංස්ථාපිත මණ්ඩලයේ කාර්යය සඳහා මුදල් ණයට ගැනීම හෝ අරමුදල් සපයා ගැනීම; සහ

(එ) සංස්ථාපිත මණ්ඩලයේ අරමුණු නිසි ලෙස සහ ඵලදායී ලෙස කරගෙන යෑම සඳහා අවශ්‍ය වන හෝ යෝග්‍ය වන අනෙකුත් සියලු දෑ කිරීම.

සංස්ථාපිත මණ්ඩලයේ රීති

**9.** (1) සංස්ථාපිත මණ්ඩලය විසින්, එහි යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණි ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන්, මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති, පහත දැක්වෙන සියලු කාරණා හෝ ඉන් කිසිවක් හෝ සඳහා කලින් කළ සෑදීම නීත්‍යනුකූල වන්නේ යː-

(අ) සාමාජිකයන් වර්ග කිරීම, සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ නෙරපීම ඔවුන් විසින් ගෙවිය යුතු ගාස්තු;

(ආ) විධායක මණ්ඩලයේ සාමාජිකයන් තෝරාපත් කර ගැනීම, ඔවුන් විසින් ධුරය හිස්කිරීම හෝ ඔවුන්ව ධුරයෙන් ඉවත් කිරීම සහ ඔවුන්ගේ බලතල, කාර්යය සහ කර්තව්‍ය;

(ඇ) සංස්ථාපිත මණ්ඩලයේ විවිධ නිලධරයන් සහ සේවකයන්ගේ පත්වීමේ නියම හා කොන්දේසි, ඔවුන්ගේ බලතල, කාර්ය, කර්තව්‍ය සහ පාරිශ්‍රමික;

(ඈ) විධායක මණ්ඩලයේ හෝ එහි යම් කමිටුවක හෝ අනුකමිටුවක රැස්වීම් කැඳවීම සහ රැස්වීම් පැවැත්වීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය,ඒ රැස්වීම් සම්බන්ධ දැන්වීම් සහ න්‍යායපත්‍ර, ඒ සඳහා ගණපූරණය සහ ඒවායේ කටයුතු පවත්වාගෙන යාම;

(ඉ) විධායක මණ්ඩලය හෝ එහි යම් කමිටු හෝ අනුකමිටුවල සාමාජිකයන් වීම සඳහා අවශ්‍ය සුදුසුකම් සහ නුසුදුසුකම්;

(ඊ) සංස්ථාපිත මණ්ඩලයේ දේපළ පරිපාලනය සහ කළමනාකරණය කිරීම; සහ

(උ) සංස්ථාපිත මණ්ඩලයේ සාමාන්‍ය කටයුතු කළමනාකරණය කිරීම, එහි අරමුණු සාක්ෂාත් කරගැනීම සහ සංස්ථාව විසුරුවා හැරීම.

(2) සංස්ථාපිත මණ්ඩලය විසින් සාදනු ලබන සෑම රීතියක්ම, (1) වැනි උපවගන්තිය යටතේ රීතියක් සාදනු ලබන ආකාරයෙන් ම, එවැනිම රැස්වීමක දී එවැනිම ආකාරයට සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන් සෑම අවස්ථාවක දී ම එහි රීතිවලට යටත් විය යුතු ය.

(4) මේ වගන්තිය යටතේ සාදනු ලබන රීති *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබිය යුතු ය.

සංස්ථාපිත මණ්ඩලයේ අරමුදල

**10.** (1) සංස්ථාපිත මණ්ඩලයට එහිම අරමුදලක් තිබිය යුතු අතර, ත්‍යාග, රික්තවරණ, පරිත්‍යාග, දයක මුදල්, සම්මාදම්, ගාස්තු හෝ ප්‍රදාන වශයෙන් සංස්ථාපිත මණ්ඩලයට ලැබෙන සියලුම මුදල්, සංස්ථාපිත මණ්ඩලයට බැර කරනු ලැබිය යුතු අතර, එම අරමුදල් විධායක මණ්ඩලය විසින් අනුමත කරනු ලබන යම් බැංකුවක හෝ බැංකුවල පවත්වාගෙන යා යුතු ය.

(2) මේ පනත යටතේ සංස්ථාපිත මණ්ඩලයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී සහ ඉටු කිරීමේ දී එය විසින් දරනු ලබන සියලු වියදම් පියවීම සඳහා අවශ්‍ය වන්නා වූ යම් මුදල් ප්‍රමාණ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාපිත මණ්ඩලය විසින් චංචල හා නිශ්චල දේපළ දැරිය හැකි බව

11. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නීයාදනයක් ප්‍රකාර හෝ වෙනත් යම් ආකාරයකින් සංස්ථාපිත මණ්ඩලය වෙත පැවරෙන්නා වූ යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීමට සහ දැරීමට මේ පනතේ විධිවිධානවලට යටත්ව සංස්ථාපිත මණ්ඩලයට නීතියෙන් බලය සහ හැකියාව ඇති අතර, එම සියලු දේපළ 9 වන වගන්තිය යටතේ සාදනු ලබන සංස්ථාපිත

මණ්ඩලයේ රීතිවලට යටත්ව, විකිණීමට, උකස් කිරීමට, බදු දීමට, හුවමාරු කිරීමට හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමට පූර්ණ බලය ඇතිව සංස්ථාවේ කාර්ය සඳහා සංස්ථාව විසින් ඒ සියලු දේපළ දැරිය යුතු ය.

මුදල් සහ දේපළ අදාළ කර ගැනීම

**12.** සංස්ථාපිත මණ්ඩලයේ මුදල් හා දේපළ, මුළුමනින් ම සංස්ථාවේ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා පමණක් අදාළ කර ගත යුතු අතර, එහි කිසිම කොටසක් සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන් වෙත ඍජුවම හෝ වක්‍රව ලාභාංශ, ප්‍රසාද, දීමනා, ලාභ හෝ වෙනත් යම් ආකාරයකින් ගෙවීම හෝ පැවරීම නොකළ යුතු ය.

ගිණුම් හා විගණනය

**13.** (1) සංස්ථාපිත මණ්ඩලය විසින් එහි ආදායම් හා වියදම්, වත්කම් හා බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගණුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබාගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(2) සංස්ථාපිත මණ්ඩලයේ ගිණුම්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවට අනුකූලව විගණකාධිපතිවරයා විසින් හෝ ඔහු විසින් පත් කරනු ලබන සුදුසුකම් ලත් විගණකවරයකු විසින් වාර්ෂිකව විගණනය කරනු ලැබිය යුතු ය.

(3) මේ වගන්තියේ කාර්ය සඳහා ''සුදුසුකම් ලත් විගණකවරයා'' යන්නෙන් -

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක්; හෝ

(ආ) ගණකාධිකාරි සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වන්නා වූ ද, ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද, එවැනි වරලත් ගණකාධිකාරි ආයතනයක්,

අදහස් වේ.

(4) සංස්ථාපිත මණ්ඩලයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

වාර්ෂික වාර්තාව

**14.** (1) විධායක මණ්ඩලය විසින් සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු පිළිබඳ වාර්තාවක් සෑම මුදල් වර්ෂයක් සඳහාම සකස් කරනු ලැබිය යුතු අතර, එම වාර්තාව විගණනය කරන ලද ගිණුම් ප්‍රකාශය ද සමග ඒ වාර්තාව අදාළ වන වසරට පසුව එන වර්ෂයේ මාස හයක් ඉකුත්වීමට පෙර බුද්ධශාසන විෂයයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(2) මුදල් වර්ෂය තුළ දී සංස්ථාපිත මණ්ඩලය වෙත දේශීය හා විදේශීය වශයෙන් ලැබුණු මුදල් පිළිබඳ වෙනම ගිණුමක් (1) වන උපවගන්තියේ සඳහන් වාර්තාවට අමුණනු ලැබිය යුතු ය.

සංවිධානයට අයවිය යුතු සහ සංවිධානයෙන් ගෙවිය යුතු ණය

**15.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී සංවිධානය විසින් ගෙවිය යුතු සියලු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාපිත මණ්ඩලය විසින් ගෙවනු ලැබිය යුතු අතර, එදිනට සංවිධානයට අයවිය යුතු සියලු ණය සහ සංවිධානයට ගෙවිය යුතු සාමාජික මුදල් සහ දයක මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාපිත මණ්ඩලය වෙත ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාපිත මණ්ඩලයේ මුද්‍රාව

**16.** (1) සංස්ථාපිත මණ්ඩලයේ මුද්‍රාව එහි ලේකම්වරයා හෝ විධායක මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන යම් තැනැත්තකුගේ භාරයේ තිබිය යුතු ය.

(2) තමන් පැමිණ සිටින බවට සලකුණක් වශයෙන් යම් සාධන පත්‍රයක තම නම් අත්සන් කළ යුතු සභාපති, ලේකම් සහ භාණ්ඩාගාරික ඉදිරිපිට දී හැර සංස්ථාවේ මුද්‍රාව කවර හෝ සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලබන අත්සන් කිරීමකට පරිභාහිරව විය යුතු ය.

සංස්ථාපිත මණ්ඩලය විසුරුවා හැරීමේ දී ඉතිරි වන දේපළ

**17.** (1) සංස්ථාපිත මණ්ඩලය විසුරුවා හරින්නේ නම් එසේ විසුරුවා හැරීමේ දී, එහි සියලු ණය සහ බැරකම් පියවීමෙන් පසු යම් දේපළක් ඉතිරි වුවහොත්, එම දේපළ එහි සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදයමක්

හෝ දේපළ ස්වකීය සාමාජිකයන් අතර බෙදාදීම තහනම් කර ඇත්තා වූ ද, වෙනත් එවැනි ආයතනයකට හෝ ආයතනවලට එම දේපළ දීම හෝ පැවරීම කළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්ය සඳහා, යෝග්‍ය වන්නා වූ ආයතනය, සංස්ථාපිත මණ්ඩලය විසුරුවා හැරීමට පෙරාතුව ම කැඳවනු ලබන මහා සභා රැස්වීමක දී ඊට පැමිණ සිටින සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කළ යුතු ය.

ජනරජයේ හෝ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම

18. ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ යම් සංස්ථාවක හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් අගතියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**19.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.